වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயல்திறன் அறிக்கை

Annual Performance Report

2020











ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
இலங்கை தேசிய புலமைச் சொத்து அலுவலகம்
National Intellectual Property Office of Sri Lanka

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

අන්තර්ගතය

	පිටුව
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ	1-8
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	9-27
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	28-53
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	54
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	55
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	56-59
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	60-76

1 ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය කිරීම සම්බන්ධ බලය පැවරී ඇත.

ඕනෑම රටක සමස්ත ආර්ථික සංවර්ධනයේ දී, විශේෂයෙන් දැනුම ප්‍රධාන වශයෙන් සක්‍රිය සහ නිසැක වශයෙන් ම වැදගත් වන වර්තමාන සංදර්භය තුළ බුද්ධිමය දේපළ අත්‍යවශ්‍ය සහ සුවිශේෂී කාර්යභාරයක් සිදු කරනු ලැබේ. මානව ප්‍රයත්න ක්‍රියාත්මක වන සෑම ක්ෂේත්‍රයක් සඳහා ම ආයෝජන, නවෝත්පාදන හා නිර්මාණශීලී ක්‍රියාකාරිත්වය, තාක්ෂණ හුවමාරුව සහ දැනුම් ප්‍රවාහයේ අවශ්‍යතාව ඉතිහාසයේ කවර කලකටත් වඩා වර්තමානයේ දී ශ්‍රී ලංකාව ද අත් විඳිමින් සිටියි. සමාලෝචනයට භාජනය කරන 2020 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පරිපාලනය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදු කරන ලද කාර්යය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ.

එයටම ආවේණික සුවිශේෂී ලක්ෂණ සහිත වන බුද්ධිමය දේපළ වනාහි එක් දේපළ ආකාරයකි. මානව බුද්ධිය මෙහෙයවා සිදුකරන නිර්මාණාත්මක කාර්යය සඳහා නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතිවාසිකම් කාණ්ඩය බුද්ධිමය දේපළ ලෙස සැලකේ. සාහිත්‍ය, කලා හෝ විද්‍යාත්මක කාර්යයන්, ප්‍රසාංගික කලා ශිල්පීන්ගේ රඟ දැක්වීම්, හඬ තැටි, විකාශය කිරීම්, නව නිපැයුම්, කාර්මික සැලසුම්, වෙළඳ ලකුණු, සේවා ලකුණු, වාණිජ නම් සහ තනතුරු, අසාධරණ තරඟයට එරෙහිව ආරක්ෂාව, භූගෝලීය දර්ශක, නව ශාක දර්ශක, හෙළිදරවු නොකළ තොරතුරු සහ සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ වැනි ක්ෂේත්‍රවලට අදාළ අයිතිවාසිකම් මීට ඇතුළත් වේ. පුද්ගලයන් විසින් හිමිකාරිත්වය දරන අනෙකුත් දේපළ ආශ්‍රිතව දක්නට ලැබෙන සමහර ලක්ෂණ බුද්ධිමය දේපළ සඳහා ද පොදු වේ. උදාහරණයක් ලෙස, බුද්ධිමය දේපළ වත්කමක් වන අතර එයට මූල්‍යමය වටිනාකමක් ද සහිත වේ. අනිත් ඕනෑම ආකාරයක දේපළක් සඳහා මෙන් බුද්ධිමය දේපළ සඳහා ද හිමිකරගැනීම, වෙනත් පාර්ශවයක් වෙත අයිතිය පැවරීම, විකිණීම හෝ බලපත්‍ර ගිවිසුම්ගත වීම ආදිය සිදුකළ හැක. බුද්ධිමය දේපළ හඳුනාගැනීම හෝ එහි භෞතික පරාමිති මඟින් නිශ්චය කරගැනීම හෝ සිදුකළ නොහැකි බැවින් බුද්ධිමය දේපළ යනු අස්පර්ශනීය දේපළකි. එසේ වුව ද, බුද්ධිමය දේපළ ආරක්ෂා කරගැනීම සඳහා එය ප්‍රත්‍යක්ෂ ආකාරයකට හෝ

ක්‍රමයකට නිශ්චිතව පළ කළ යුතු වේ. කාර්මික දේපළ සහ ප්‍රකාශන හිමිකම් වශයෙන් බුද්ධිමය දේපළ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,

1. නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු සහ සේවා ලකුණු, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශක අන්තර්ගත කාර්මික දේපළ සහ,

2. ශාස්ත්‍රීය හා කලාත්මක කෘති ආවරණය කරන ප්‍රකාශන අයිතිය, ප්‍රාසාංගික කලාකරුවන්ගේ ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් නිෂ්පාදකයන්ගේ සහ විකාශන සංවිධානවල අයිතිවාසිකම් සම්බන්ධිත අයිතිවාසිකම් හෝ සමීපස්ථ අයිතිවාසිකම් ලෙස හැඳින්වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වෙළඳ පොළ කේන්ද්‍රීය බුද්ධිමය දේපළ පද්ධතියක් දේශය වෙත ලභාකර දීමේ අභිප්‍රායෙන් යුතුව ගුණාත්මක බව අරමුණු කරගත් ඵලදායි සේවා සපයන ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

බුද්ධිමය දේපළ නිර්මාණය, ආරක්ෂා කිරීම හා වාණිජකරණය ඔස්සේ ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපනය වීම සහතික කිරීම.

අරමුණු

I.	ජාතියේ නිර්මාණශීලීත්වය ප්‍රවර්ධනය කිරීම
II.	වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම
III.	ආයෝජන ප්‍රවර්ධනය
IV.	පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම සහ දැනුම මූලික කර ගත් ගෝලීය ක්‍රියාකාරීත්වයට ජාතික ආර්ථිකය ඒකාබද්ධ කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

I.	වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම ඇතුළුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම.
II.	බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සහ ප්‍රචලිත කිරීම.
III.	බුද්ධිමය දේපළ විෂය පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම.
IV.	ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
V.	බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර්ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
VI.	බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම.
VII.	ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය; බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම.
VIII.	බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය.

1.4 සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ



වෙළඳ ලකුණු අංශය

බුද්ධිමය දේපළ යටතේ කාර්මික දේපළ ලෙස වර්ගීකරණය කර ඇති වෙළඳ ලකුණු සහ සේවා ලකුණු ලියාපදිංචි කිරීමේ කටයුතු ඉටුකරමින් වෙළඳ ලකුණු අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන පරිදි වෙළඳ ලකුණු අයදුම්පතක් එහි ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකිරීම දක්වා සංකීර්ණ ක්‍රියාවලියකට භාජනය වේ.

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන සියළුම අයදුම්පත් එහි විධිමත්භාවය සඳහා පරීක්ෂා කරන අතර විධිමත්භාවය සම්බන්ධ අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ නම් සෝදිසි පරීක්ෂාව බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය (IPAS - Industrial Property Automation System) හරහා සිදුකරනු ලැබේ. එසේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලකුණු රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා භාර ගන්නා අතර ප්‍රතික්ෂේපිත අයදුම්පත් සඳහා එකී අයදුම්කරුවන්ට අවශ්‍ය නම් කරුණු විභාග කිරීමකට හෝ ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ලිඛිත කරුණු දැක්වීමකට යොමු විය හැකි ය. පිළිගනු ලැබූ ලකුණු, පළකිරීම ගාස්තු (ප්‍රසිද්ධ කිරීමේ ගාස්තු) ගෙවීමෙන් අනතුරුව, රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන අතර මාස තුනක කාලයකින් අනතුරුව නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව ලියාපදිංචි

කිරීමේ සහතික නිකුත් කරනු ලැබේ. ප්‍රකාශයට පත්කළ වෙළඳ ලකුණකට එරෙහිව තෙවන පාර්ශවයක් විසින් විරෝධතාවයක් ගොනුකරනු ලබන අවස්ථාවක දී, විරෝධතා පරීක්ෂණ ආරම්භ කරනු ලැබිය හැකි අතර එම විරෝධතා පරීක්ෂණය අවසන් කිරීමෙන් අනතුරුව තීරණය ප්‍රකාශයට පත් කරනු ලැබේ. එවැනි තීරණයකින් අගතියට පත්වන පාර්ශවයක් වෙතොත්, ඔවුනට කොළඹ වාණිජ මහාධිකරණයේ අභියාචනයක් ගොනු කිරීමට හැකියාව පවතී.

අධ්‍යක්ෂ (නීති) මෙම අංශයේ ප්‍රධානත්වය උසුලන අතර සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ බුද්ධිමය දේපළ නිලධාරීන් අට දෙනෙකු, සංවර්ධන නිලධාරීන් පහලොස් දෙනෙකු, එක් කළමනාකරණ සේවා නිලධරයකු හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සිවු දෙනෙකුගෙන් සමන්විත තිස් දෙකක කාර්ය මන්ඩලයක් විසින් මෙම අංශයේ කාර්යයන් ඉටු කරනු ලැබේ. අංශයේ සමස්ථ අධීක්ෂණය හා මඟ පෙන්වීම සඳහා බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් වග කියනු ලැබේ.

පේටන්ට් හා කාර්මික සැලසුම් අංශය

පේටන්ට් සහ කාර්මික සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ පේටන්ට් අයදුම්පත් පරීක්ෂා කර පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම හා කාර්මික සැලසුම් අයදුම්පත් පරීක්ෂා කිරීමේ සහ ලියාපදිංචි කිරීම සම්බන්ධ කටයුතු වේ.
අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, සංවර්ධන නිලධාරීන් දස දෙනෙකු හා කළමනාකරණ සේවා නිලධරයකු හා කාර්යාල කාර්ය සහායකවරයකුගෙන් සමන්විත වේ.

පේටන්ට් සහ කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යෑම පේටන්ට් අංශය මඟින් සිදු කරනු ලබන අතර අදාළ තොරතුරු පොදු ජනතාව, විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පාර්ශවකරුවන් අතර ව්‍යාප්ත කරවීම සඳහා ද වගකීම දරනු ලැබේ.

මෙම කාර්යාලය විසින් දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් ගොනු කරනු ලබන පේටන්ට් අයදුම්පත් පරීක්ෂා කර, අදාළ සුදුසුකම් සපුරාලන නව නිපයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලබා දී අදාළ ආරක්ෂාව ප්‍රදානය කෙරේ. එසේ පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීමෙන් අනතුරුව ඊට අදාළ අලුත්වැඩියා කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් යනාදී පසු ලියාපදිංචි කිරීමේ කටයුතු හා සම්බන්ධ විවිධ කාර්යයන් ද මෙම කාර්යාලය විසින් පරිපාලනය කරනු ලැබේ. විද්‍යා සහ වෙළඳ ප්‍රජාවන්, පර්යේෂණ හා සංවර්ධන ආයතන, කර්මාන්තකරුවන් ඇතුලු අනෙකුත් අදාළ පාර්ශවයන්හි ප්‍රයෝජනය සඳහා දේශීය සහ අන්තර්ජාතික වශයෙන් පවතින පේටන්ට් සහ තාක්ෂණික තොරතුරු රැස්කර බෙදා හැරීමේ කාර්යය සඳහා ද මෙම අංශය වගකියනු ලැබේ.

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා අදාළ සුදුසුකම් සපුරන අයදුම්පත් ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මගින් සිදු කරන අතර, අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් ඇතුළු ලියාපදිංචියෙන් අනතුරුව සිදුකළ යුතු කටයුතු ද මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීම සහ බෙදා හැරීම ද මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ අංශය

බුද්ධිමය දේපළ ක්‍රියාවලියේ විවිධ පියවර වලට බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (IPAS-Industrial Property Administrative System) යාවත්කාලීන කිරීම, අයදුම්පත් ගොනු කිරීමේ දී පරිගණක පද්ධතිය හරහා වෙළඳ ලකුණු හා පේටන්ට් යනාදී සියල්ල පරික්ෂා කිරීමට හා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම, වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම යනා දී තොරතුරු තාක්ෂණ කාර්යයන් ද මෙම අංශය යටතේ ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) ප්‍රධානත්වය දරන මෙම අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධරයකුගෙන් හා සංවර්ධන නිලධාරියකුගෙන් සමන්විත වේ.

ආයතන අංශය

මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණු අවස්ථා ලබාදීම සහ යටිතල පහසුකම් සැපයීම ආදී කාර්යයන් ආයතන අංශය විසින් සිදු කරනු ලැබේ. පරිපාලන නිලධාරිණිය විසින් අධීක්ෂණය කරනු ලබන මෙම අංශය එක් භාෂා පරිවර්තක නිලධාරියෙකුගෙන්, එක් සංවර්ධන නිලධාරියෙකුගෙන්, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන් සිව් දෙනකුගෙන්, රියදුරන් හතර දෙනෙකුගෙන් හා කාර්යාල කාර්යය සහායකවරු දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

ගිණුම් අංශය

මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සියලුම අදායම් සරප් කවුළුවක් මගින් භාරගැනීම,ආදායම් නිසි පරිදි වර්ගීකරණය කොට නිවැරදිව ගිණුම්ගත කිරීම, කාර්යාලයීය නිලධාරීන්ගේ වැටුප් වේතන ගෙවීම හා කාර්යාලයීය වියදම් හා ගෙවීම් කටයුතු, ආයතනික ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාකරණය, ප්‍රසම්පාදන කටයුතු හා බුද්ධිමය දේපළ අරමුදලේ අරමුදල් කළමනාකරණය

ගිණුම් අංශය සතු ප්‍රධාන කාර්යයන් වේ. මෙම ශාඛාවේ ගණකාධිකාරී අධීක්ෂණය යටතේ නිලධාරීන් දස දෙනෙකු සේවයේ නිරත වේ.

2020 වසරෙහි උද්ගතවූ කොවිඩ් වසංගත තත්ත්වය යටතේ කාර්යාලය වසා තැබූ සහ සීමිත සේවාවන් සපයන ලද කාල සීමාව තුළ සියලු ආදායම් ලබා ගැනීම මාර්ග ගත ක්‍රමයට සිදු කිරීමට මෙම අංශය විසින් කටයුතු කරන ලදි.

සැලසුම් අංශය

ආයතනයෙහි දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ වලට අනුකූලවන ලෙසින්, අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා උපායමාර්ග සැලසුම සකස් කිරීමත්, ආයතනික ශක්‍යතාව සහ හදුනා ගන්නා ලද සංවර්ධන විභවතා මත පදනම්ව, ආයතනයෙහි විශේෂිත අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත්, එයට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීමත්, අධීක්ෂණය සහ පසුවිපරම් කිරීමත්, ප්‍රගතිය විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීමත්, විශේෂයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය වෙත ඉදිරිපත් කලයුතු සංඛ්‍යාලේඛණ සහ ප්‍රගති වාර්තා අවශ්‍ය විශ්ලේෂණයන් සහිතව ඉදිරිපත් කිරීමත්, සේවාලාභී ප්‍රඥප්තිය ආයතනය තුළ ස්ථාපිත කිරීම මගින් ආයතනය සහ මහජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ විශ්වාසනීයත්වය ඉහල නැංවීමත්, එමගින් ආයතනික ඵලදායීතාව ඉහල නැංවීමත්, ආයතනයෙහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සහ නිලධාරීන්ගේ කාර්යසාධනය හා සම්බන්ධ සැලසුම් සකස් කිරීමත්, ආයතනයේ ඉලක්ක වලට අනුකූලව දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා හදුනාගැනීමත්, සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ගෙවීම් කටයුතු වලට අනුකූලව නිර්දේශ ඉදිරිපත් කිරීමත්, ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා සහය වීමත්, සැලසුම් අංශයෙහි කාර්යභාරය ලෙස දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි සැලසුම් අංශය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) වරයකුගෙන් සහ සංවර්ධන නිලධාරීන් දෙදෙනකුගෙන් සමන්විත වේ.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

බුද්ධිමය දේපළ අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

නැත

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 මූල්‍ය ප්‍රගතිය

ආදායම

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2020.12.31 දිනට මුළු ආදායම රු.මි.159.9 කි. ඉන් 60% ක් බුද්ධිමය දේපළ පනත යටතේ වන ගාස්තු අය කිරීම් මගින් රැස්කළ ආදායම වන අතර, ඉතිරි 40% බුද්ධිමය දේපළ අරමුදලේ ආදායම් අතිරික්තය ආයෝජනය කිරීම මගින් ලද පොලී ආදායම වේ.

බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන පරිදි, බුද්ධිමය දේපළ පනත යටතේ උපයනු ලබන ආදායම් වලින් 1/3 කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, 2020.12.31දින වන විට එකී වර්ෂය සඳහා එසේ බැර කළ මුදල රු.මි.31.7 කි.

ප්‍රස්ථාරය 1 : 2020.12.31 දිනට සමස්ත ආදායම



වියදම

බුද්ධිමය දේපළ අරමුදල පරිපාලන කිරීමේ කටයුතු වෙනුවෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන්ගේ පුද්ගල පඩිනඩි හා වැටුප් ගෙවීම් සඳහා ශීර්ෂ අංක 299 යටතේ රජය විසින් රු.මි 39.7ක ප්‍රතිපාදන දරා ඇත. ඉතිරි සියලු වියදම් බුද්ධිමය දේපළ අරමුදල විසින් දරා ඇත. 2020.12.31 දිනට බුද්ධිමය දේපළ අරමුදලෙන් වැය කර ඇති සමස්ත මුදල රු.මි. 52.4 කි.

ප්‍රස්ථාරය 2 : 2020.12.31 දිනට සමස්ත වියදම



2.2 භෞතික ප්‍රගතිය

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රගතිය වෙළඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලසුම් යන ප්‍රධාන අංශ තුනක් යටතේ ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව,

- **වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය**

වගුව 1: 2020.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ලකුණු ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්යයන්)		
	ඇස්තමේන්තුගත	සත්‍ය	%
අයදුම්පත් ලැබීම්	11,900	9,593	81%
1. සෝදිසි පරීක්ෂාව සහ සෝදිසි වාර්තා සැකසීම	16,836	12,551	75%
2. අයදුම්කරුවන් වෙත ලිපි යැවීම (ලකුණු පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව)	17,284	9,511	55%
ප්‍රකාශන ගාස්තු ගෙවූ අයදුම්පත් සංඛ්‍යාව	11,533	3,918	34%
3 වෙළඳ ලකුණු පළ කිරීමට අදාළ ප්‍රකාශන ගාස්තු ගෙවීමෙන් අනතුරුව එම අදාළ වෙළඳ ලකුණු සම්බන්ධ ගැසට් නිවේදන සැකසීම සඳහා යොමු කිරීම	14,336	7,684	54%
ලියාපදිංචි ගාස්තු ගෙවූ අයදුම්පත් සංඛ්‍යාව	10,844	6,773	62%
4. වෙළඳ ලකුණු සම්බන්ධ ගැසට් නිවේදන රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.	14,298	5,932	41%

ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ අයදුම්පත් සංඛ්‍යාව		4,258	4,127	97%
	5. ලියාපදිංචිය අලුත් කළ අයදුම්පත් සංඛ්‍යාව	4,936	2,456	50%
ලකුණු සම්බන්ධිත පැවරුම් සඳහා ගෙවීම්		1,494	1,162	78%
	6. පැවරුම් වාර්තා කර තැබීම	3,383	510	15%
	7. නම්/ලිපිනයන්ගේ සිදුවන වෙනස් වීම් වාර්තා කර තැබීම	1,775	589	33%
	8.ගොනු ඉවත් කිරීම්	1,200	1,188	99%
	9. ලිඛිත ගොනු කිරීම් හා දිවුරුම් ප්‍රකාශ ආකාරයෙන් ලබාදෙන සාක්ෂි සලකා බලා ප්‍රතික්ෂේපිත අයදුම්පත් නැවත සලකා බැලීම	2,400	1,357	57%

COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් කොළඹ නගරයේ ආයතනය පිහිටි ප්‍රදේශය වසාදැමීම මත මෙම වසර තුළ මාස තුනක පමණ කාලයක් කාර්යාලය විවෘත නොකරන ලදී.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා එම කාලය තුළ ද නිලධාරීන් නිවසේ සිට වැඩ කිරීම (WFH) සිදු කළ අතර මාස තුනක කාලයක් කාර්යමණ්ඩලයෙන් 1/3 ක ප්‍රමාණයක් පමණක් සේවයට කැඳවන ලදී. එවන් දුෂ්කර රාජකාරිමය අවස්ථාවක වුව ද වෙළඳ ලකුණු අංශයෙහි ඇතැම් ක්‍රියාකාරකම් වලින් 100% වඩා ඉහල ප්‍රගතියක් අත්කර ගැනීමට බුද්ධිමය දේපළ කාර්යාලයට හැකි වී තිබේ.

- **වෙළඳ ලකුණු අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය විශ්ලේෂණය**

ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ වෙළඳ ලකුණු අංශයෙහි ප්‍රගතිය විශ්ලේෂණය සිදු කර තිබේ. ඒ අනුව,

අ) ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වගුව 2: ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව	11,282	11,483	10,385	9,593
සෝදිසි පරීක්ෂාව සිදු කල අයදුම්පත් සංඛ්‍යාව	21,606	6,542	10,224	12,551

ප්‍රස්ථාරය 3: ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 2 හා ප්‍රස්තාරය - 3 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරන අතර 2018 සිට ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව පරීක්ෂා කරන ලද අයදුම්පත් සංඛ්‍යාවෙහි ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

ආ) ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව 3: ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	11,282	11,483	10,385	9,593
ලියාපදිංචි කල අයදුම්පත් සංඛ්‍යාව	10,622	5,192	14,993	5,932

ප්‍රස්ථාරය 4: ලැබුණු වෙළඳ ලකුණු අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 3 හා ප්‍රස්ථාරය - 4 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව අතර සංසන්දනයක් පෙන්නුම් කරයි. ඒ අනුව වර්ෂයක් හැර වර්ෂයක් නිරීක්ෂණය කල හැකි උච්ඡාවචනය මෙවර ද දැකිය හැකි අතර 2020 වසරේ දී ලැබුණු අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව අඩු ලියාපදිංචි සංඛ්‍යාවක් නිරීක්ෂණය කල හැකි ය. කෙසේවුව ද පැවති කොවිඩ් තත්ත්වය මත ඇතැම් කාර්යාලීය රාජකාරි ඒ අයුරින්ම නිවසේ සිට වැඩකිරීම (WFH) මගින් ආවරණය කල නොහැකි වීම ද මෙයට හේතුවක් විය හැකි ය.

ඇ) ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය කිරීම

වගුව 4: ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වර්ෂය	2017	2018	2019	2020
දේශීය ලකුණු	6,324	1,998	5,250	2442
විදේශීය ලකුණු	4,298	3,194	9,743	3590

ප්‍රස්ථාරය 5: ලියාපදිංචි කළ වෙළඳ ලකුණු දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 4 හා ප්‍රස්ථාරය - 5 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති වෙළඳ ලකුණු අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන්කර පෙන්නුම් කරයි.

- **පේටන්ට් අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය**

වගුව - 5 : 2020.12.31න් අවසන් වූ වර්ෂය සඳහා පේටන්ට් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

කාර්යයන්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්යයන්)			අවධානිත කරුණු
	ඇස්තමේන්තුගත	සත්‍ය	%	
01. අයදුම්පත් ලැබීම්	555	603	109%	
02 අයදුම්පත් හා සම්බන්ධ මූලික පරීක්ෂාව (දේශීයව ගොනු කළ අයදුම්පත්, ජාත්‍යන්තරව ගොනු කළ අයදුම්පත් හා පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) යටතේ ගොනු කළ අයදුම්පත්)	1000	557	56%	**
03. අයදුම්පත පේටන්ට් බලපත්‍රයක් ලබාදීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්දැයි සඳහා පරීක්ෂාව	1220	922	76%	විශේෂ ව්‍යාපෘතියක් ලෙස පලවන කාර්තුව සඳහා පරීක්ෂණ 500ක් සිදු කිරීම ඉලක්කගත කරන ලදී. (ඉතිරි කාර්තු 03 සඳහා පරීක්ෂණ 240 බැගිනි)
04. සංශෝධන පරීක්ෂා කිරීම	175	333	190%	
05. ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	4	5	125%	
06. පේටන්ට් බලපත්‍ර ප්‍රදානය සඳහා සහතිකපත් සැකසීම	240	273	114%	
07. ලියපදිංචි කල පේටන්ට් බලපත්‍ර අලුත් කිරීම	640	322	50%	ලියපදිංචි කල පේටන්ට් බලපත්‍ර අලුත් කිරීම සඳහා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව ඉලක්ක ගත සංඛ්‍යාවට වඩා අඩු අගයකි. (ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 510 කි. සාපේක්ෂව ප්‍රතිශතය 63% කි)
08. පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	880	497	56%	**
09. පැවරුම් සඳහා අවසර ලබා දීම	*	1		* නම්/ ලිපිනයන් වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් නිශ්චිතව ඉලක්ක ගත කිරීම අසීරු වේ.
10. පිටපත්/ සහතික කළ පිටපත් ලබා දීම	*	18		
11. නම්/ ලිපිනයන් වෙනස් කිරීම	*	11		

** COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් කොළඹ නගරයේ ආයතනය පිහිටි ප්‍රදේශය වසාදැමීම මත මෙම වසර තුළ මාස තුනක පමණ කාලයක් කාර්යාලය විවෘත නොකරන ලදී.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා එම කාලය තුළ ද නිලධාරීන් නිවසේ සිට වැඩ කිරීම (WFH) සිදු කළ අතර මාස තුනක කාලයක් කාර්යමණ්ඩලයෙන් 1/3 ක ප්‍රමාණයක් පමණක් සේවයට කැඳවන ලදී. එවන් දුෂ්කර රාජකාරිමය අවස්ථාවක වුව ද පේටන්ට් අංශයෙහි ඇතැම් ක්‍රියාකාරකම් වලින් 100% වඩා ඉහල ප්‍රගතියක් අත්කර ගැනීමට බුද්ධිමය දේපළ කාර්යාලයට හැකි වී තිබේ.

- **පේටන්ට් අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය විශ්ලේෂණය**

ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ පේටන්ට් අයදුම්පත්වල ප්‍රගති විශ්ලේෂණය සිදු කර තිබේ. ඒ අනුව,

අ) ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කල අයදුම්පත් සංඛ්‍යාව

වගුව 6: ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කල අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව	543	603	611	603
සෝදිසි පරීක්ෂාව සිදු කල අයදුම්පත් සංඛ්‍යාව	1,120	1,059	1,117	922

ප්‍රස්ථාරය - 6 : ලැබුණු පේටන්ට් අයදුම්පත් වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව සිදු කළ අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 6 හා ප්‍රස්තාරය - 6 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂ ව පරීක්ෂා කරන ලද අයදුම්පත් සංඛ්‍යාව ඉතා ඉහල අගයක් ගන්නා බව පෙන්නුම් කරයි. ඒ අනුව පේටන්ට් අංශයෙහි දැනට අතපසු වී ඇති කාර්යය ප්‍රමාණයෙහි ක්‍රමික අඩු වීමක් ඉදිරියේ දී අපේක්ෂා කල හැකි වේ.

ආ) ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වගුව - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	543	603	611	603
පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව	181	212	175	273

ප්‍රස්ථාරය - 7 : ලැබුණු පේටන්ට් අයදුම්පත්වලට සාපේක්ෂව පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව



වගුව - 7 හා ප්‍රස්තාරය - 5 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව හා පේටන්ට් බලපත්‍ර ලබා දුන් සංඛ්‍යාව පෙන්නුම් කරයි. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී වැඩි පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කිරීමට හැකි ව තිබේ.

ඇ) පේටන්ට් බලපත්‍ර ලබා දුන් අයදුම්පත් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 8 : ලියාපදිංචි කළ පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වර්ෂය	2017	2018	2019	2020
දේශීය	54	64	39	47
විදේශීය	127	148	136	226

ප්‍රස්ථාරය - 8 : පේටන්ට් බලපත්‍ර ලබා දුන් අයදුම්පත් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 8 හා ප්‍රස්තාරය - 8 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති පේටන්ට් අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන්කර පෙන්නුම් කරයි. ඒ අනුව විදේශීය අයදුම්පත් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වර්ධනයක් නිරීක්ෂණය කල හැකි වේ.

- **කාර්මික සැලසුම් අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය**

වගුව - 9 : 2020.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා කාර්මික සැලසුම් ආශ්‍රිත කාර්යයන්ගේ කාර්යසාධනය

ප්‍රධාන කාර්යයන්	භෞතික ප්‍රගතිය (ඉටු කරන ලද කාර්යයන්)		%	අවධානිත කරුණු
	ඇස්තමේන්තුගත	සත්‍ය		
01. අයදුම්පත් ලැබීම (දේශීයව හා ජාත්‍යන්තරව ගොනු කළ ඉල්ලුම්පත්)	330	281	85%	රට තුළ පැවතෙන කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය 2020 වර්ෂය තුළ දී සැලකිය යුතු කාලසීමාවක් සඳහා වසා තැබීමට සිදුවිය. නමුත් නිවසේ සිට රාජකාරි කටයුතු ඉටු කිරීමේ ක්‍රමවේදය මාස 04ක පමණ කාලසීමාවක් අනුගමනය කළ අතර මාස 03ක පමණ කාල සීමාවක් සඳහා සමස්ථ කාර්යමණ්ඩලයෙන් 1/3ක් පමණක් සේවයට කැඳවනු ලැබීම ඔස්සේ මෙම ප්‍රගතිය ලබාගෙන තිබේ.
02. අයදුම්පත්වල මූලික පරීක්ෂාව (දේශීයව හා ජාත්‍යන්තරව ගොනු කළ ඉල්ලුම්පත්)	400	381	95%	
03. අයදුම්පත්වල සෝදිසි පරීක්ෂාව (දේශීයව හා ජාත්‍යන්තරව ගොනු කළ ඉල්ලුම්පත්)	320	288	90%	
04 ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ජර්නල් සැකසීම	4	3	75%	
05. කාර්මික සැලසුම් සඳහා සහතිකපත් සැකසීම	200	151	76%	
06. ලියපදිංචි කල කාර්මික සැලසුම් අලුත් කිරීම	150	125	83%	
07. පොදු මහජනතාව සඳහා තොරතුරු සැපයීම/ දේශීය දත්ත සමුදායන් වෙත ප්‍රවේශ වී තොරතුරු ලබා ගැනීම	240	188	78%	
08. පැවරුම් සඳහා අවසර ලබා දීම	*	1		* මෙම කාර්යයන් සඳහා කරනු ලබන ඉල්ලීම් නිශ්චිතව ඉලක්කගත කිරීම අසීරු වේ. අදාළ කාර්යයන් ඉටු කරනු ලබන්නේ ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව ය.
09. පිටපත්/ සහතික කළ පිටපත් ලබා දීම	*	51		
10. නම්/ ලිපිනයන් වෙනස් කිරීම	*	-		

- **කාර්මික සැලසුම් අයදුම්පත් සම්බන්ධ ප්‍රගතිය විශ්ලේෂණය**

ප්‍රධාන ක්‍රියාකාරකම් 3ක් යටතේ වෙළඳ ලකුණු අංශයෙහි ප්‍රගතිය විශ්ලේෂණය සිදු කර තිබේ. ඒ අනුව,

අ) ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	336	288	546	281
සෝදිසි පරීක්ෂාව සිදු කල අයදුම්පත් සංඛ්‍යාව	259	242	449	288

ප්‍රස්ථාරය - 9 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව සෝදිසි පරීක්ෂාව කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 10 හා ප්‍රස්ථාරය - 9 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා පරීක්ෂා කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි.

ආ) ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වගුව - 11 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කළ අයදුම්පත් සංඛ්‍යාව

වර්ෂය	2017	2018	2019	2020
ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව	336	288	546	281
ලියාපදිංචි කල අයදුම්පත් සංඛ්‍යාව	330	124	258	151

ප්‍රස්ථාරය - 10 : ලැබුණු කාර්මික සැලසුම් අයදුම්පත්වලට සාපේක්ෂව ලියාපදිංචි කරන ලද අයදුම්පත් සංඛ්‍යාව



වගුව - 11 හා ප්‍රස්තාරය - 10 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව හා ලියාපදිංචි කළ කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව පෙන්නුම් කරයි. ඒ අනුව 2019 වසරේ දී ලැබුණ අයදුම්පත් සංඛ්‍යාවෙහි දැකිය හැකි වූ අසාමාන්‍ය වර්ධනය මෙවර සමනය වී ඇති බව නිරීක්ෂණය කල හැකි ය.

ඇ) ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය

වගුව - 12 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය.

වර්ෂය	2017	2018	2019	2020
දේශීය	189	86	197	122
විදේශීය	141	38	61	29

ප්‍රස්ථාරය - 11 : ලියාපදිංචි කළ කාර්මික සැලසුම් දේශීය හා විදේශීය වශයෙන් වර්ගීකරණය



වගුව - 12 හා ප්‍රස්තාරය - 11 මගින් පසුගිය වසර හතර තුළ ලැබී ඇති කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව දේශීය හා විදේශීය වශයෙන් වෙන්කර පෙන්නුම් කරයි. පෙර වසර වලට සාපේක්ෂව 2020 වසරේ දී ලියාපදිංචි කළ විදේශීය කාර්මික සැලසුම් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන පසුබෑමක් නිරීක්ෂණය කල හැකිය.

2.3 විශේෂ ජයග්‍රහණ

✓ වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය වෙත අයදුම් කිරීමට හා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මෙම වසර තුළ

ලැබී ඇත. ඒ අනුව සංශෝධිත යෝජනා ඇතුළත් පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- ✓ කතෘභාග අයිතිය සංගීත ක්ෂේත්‍රයේ කලාකරුවන් වෙත හිමිකර දීම සම්බන්ධයෙන් අවම ගාස්තු නියම කර අංක 2164/70 හා 2020.02.28 දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත.
- ✓ එනම්, ගීතයක් හෝ සංගීතමය කෘතියක් ගුවන් විදුලියේ එක් වරක් විකාශනය කිරීමේදී රු. 20 ක අවම මුදලක් හා රූපවාහිනී නාලිකාවකින් විකාශනය කිරීමේදී රු. 100 ක අවම මුදලක් එම ගීතය වෙනුවෙන් කතෘ භාගය ලෙස ගෙවිය යුතුවේ.
- ✓ කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් ක්‍රමයේ සාමාජික රටක් බවට පත්වීම සඳහා වන මූලික අධ්‍යයන කටයුතු සිදුකර අවසන් කර ඇත.
- ✓ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා බුද්ධිමය දේපළ පනත සඳහා යෝජිත සංශෝධනය සහිත කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.
- ✓ පොදු ජනතාවට ජේටන්ට් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් වැඩි කිරීම සඳහා නව තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (TISC) 4ක් මෙම වසර තුළ ස්ථාපනය කිරීමට අංශය කටයුතු කරමින් පවතී.
- ✓ මරකේෂ් ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව තුළ ඇති කල යුතු ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනතට ඇතුළත් කළ යුතු සංශෝධනයන් සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත.
- ✓ ශ්‍රී ලංකාව තුළ සංයුක්ත පරිපථ (Integrated Circuit - IC)) නව නිපැයුම් ලියාපදිංචි කිරීමේ පහසුකම් ඇති කිරීම සඳහා මූලික අධ්‍යයන කටයුතු අවසන් කිරීමට හැකිවී ඇත.
- ✓ ජේටන්ට් හා කාර්මික සැලසුම් ලිපිගොනු සුරක්ෂිත කිරීම, අයදුම්පත් පරීක්ෂා කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම, දත්ත සඳහා ප්‍රවේශය වේගවත් කිරීම සඳහා සැලසුම් කරන ලද ගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මෙම වසර තුළ ව්‍යාපෘති යෝජනාවක් සකස් කර මූලික කාර්යයන් ආරම්භ කිරීමට හැකියාව ලැබී ඇත.
- ✓ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ නවෝත්පාදනයන් සහ වාණිජකරණය වේගවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීමේ ව්‍යාපෘතිය සඳහා වැඩමුළු පැවැත්වීමට හැකිවී ඇත.
- ✓ පනත සංශෝධනය කිරීම හා නව රෙගුලාසි සකස් කිරීම වැනි ප්‍රතිපත්ති මට්ටමේ තීරණ ගැනීම සඳහා පවත්වනු ලබන බුද්ධිමය දේපළ උපදේශක කමිටු රැස්වීම් හතරක් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුව ද සාර්ථකව පැවැත්වීමට හැකි වී ඇත.

කොවිඩ් 19 වසංගත පැවති කාලය තුළ අයදුම්කරුවන්ට සහ සේවාලාභීන්ට සේවා සැපයීම සඳහා මාර්ග-ගත ගොනු කිරීමේ ක්‍රමවේදයක් 2020 මාර්තු මස සිට මහජනතාවට හඳුන්වාදීමට හැකියාව ලැබුණු අතර, ඒ අනුව අඛණ්ඩව සේවා පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත.





2020 වසරේ පවත්වන්නට යෙදුන, “හොඳම වාර්ෂික වාර්තාව - 2018” සම්මාන උළෙලේ දී දෙපාර්තමේන්තු වර්ගීකරණය යටතේ, 2018 වාර්ෂික වාර්තාව සඳහා බුද්ධිමය දේපළ කාර්යාලය පළමු අනුශූරතාව සම්මානය දිනා ගැනීම.

2.4 අභියෝග

- **ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොපැවතීම සහ ප්‍රමාණවත් ඉඩපහසුකම් නොවීම.**

මෙම දෙපාර්තමේන්තුව 1993 සිට මේ දක්වා වසර 27කට අධික කාලයක් මුළුල්ලේ පවත්වා ගෙන යනු ලබන්නේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අයත් සමාගම් මැදුර ගොඩනැගිල්ලෙහි කුලී පදනම මත ලබාගත් 3වන මහලෙහි සහ 2 වන මහලෙහි කොටසක් අයත් වන සීමිත කාර්යාලීය ඉඩ ප්‍රමාණයක ය. ගොඩනැගිල්ලෙහි මෙම ඉඩ ප්‍රමාණය ද ආපසු ලබාදෙන ලෙස වසර පහකට

අධික කාලයක් තිස්සේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ඉල්ලීම් අනුව, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙනත් සුදුසු ස්ථානයක ස්ථානගත කිරීම සඳහා ප්‍රයත්න දරන ලදී.

මෙම සමාලෝචිත කාල සීමාව තුළ ද රාජ්‍ය ආයතන කිහිපයක් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ ද, එම ප්‍රයත්නයන් සඵල නොවූ බැවින්, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත මෙතෙක් සුදුසු කාර්යාලීය ගොඩනැගිල්ලක් ලබාගැනීමට නොහැකි වී තිබේ.

එවැනි තත්ත්වයක් යටතේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය නවීකරණය සඳහා මහා භාණ්ඩාගාරයෙන් වෙන් කළ ප්‍රතිපාදන වැය කරන ලද්දේ නම් එය නිෂ්කාර්ය වියදමක් වීමට ඉඩ තිබුණ බැවින් සමාලෝචිත වර්ෂය තුළ දී ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය නවීකරණය කිරීමේ යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදුකළ නොහැකි විය.

- **ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන "කාර්මික දේපළ පරිපාලන පද්ධතිය" (Industril Property Atomation System-IPAS) වැඩිදියුණු කිරීමේ දුෂ්කරතාව.**

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා e-NIPO ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන නියෝජිතායතනය (ICTA) සමග 2016 වසරේදී එලඹෙන ලද අවබෝධතා ගිවිසුම එම ආයතනය විසින් උල්ලංඝනය කිරීම හේතුවෙන් e-NIPO ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම අඩාලවන ලදී. මෙම අර්බුදය හේතුවෙන් මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වුව ද මේ සම්බන්ධයෙන් 2020 වසරේ ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට ලද අනුමැතිය පරිදි මෙම ව්‍යාපෘතිය ඉටු කර ගැනීමට අවශ්‍ය සහය ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන නියෝජිතායතනය මගින් ලබා දිය යුතු බවට තීරණය විය.

- **මැඩ්රිඩ් ප්‍රඥප්තියට අනුගත වීම.**

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම හා එයට අනුකූල වන ලෙස බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම හදුනා ගන්නා ලද අභියෝගයක් වේ.

2.5 අවදානම් විශ්ලේෂණය හා අවම කිරීමේ උපාය මාර්ග

2020 වර්ෂය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි විෂය පථය හා සම්බන්ධව සුවිශේෂී අවධානම් සහිත අංශ හෝ කාර්යයන් හදුනාගෙන නොමැත. එසේ වුව ද රටපුරා උද්ගතව ඇති

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ සෞඛ්‍ය අවධානම මත මිනිස් ක්‍රියාකාරකම් සීමා වීම මෙම වසර තුල දී ආයතනයෙහි ප්‍රගතිය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදි.

සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුගතව කටයුතු කිරීම හා වසංගතයේ බලපෑම විශාල වශයෙන් පැවති කාලසීමාවේදී කාර්යමණ්ඩලයෙන් 1/3 ක් සේවයට කැඳවීම සහ නිවසේ සිට රාජකාරි කිරීම (WFH) ක්‍රමවේදයක් හඳුන්වා දීම මගින් ඉහත බලපෑම අවම කිරීමට ආයතනය විසින් කටයුතු කරන ලදි.

2.6 ඉදිරි ඉලක්ක

කෙටි කාලීන ඉලක්ක

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් ලබා ගැනීම සහ ඵලදායිතාවය වැඩි වන ලෙස කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- බුද්ධිමය දේපළ පනතට යෝජිත සංශෝධනයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම.
- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ආකර්ෂණීය සහ ඉහල ඵලදායීතාවක් සහිත රාජ්‍ය ආයතනයක් බවට නහාලීම.
- පොදු ජනතාවට පේටන්ට් තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් වැඩි කිරීම සඳහා නව තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන 2ක් (TISCs) 2021 වසර තුළ දී ස්ථාපනය කිරීම.
- සංයුක්ත පරිපථ (Integrated Circuit (IC)) ලියාපදිංචි කිරීම පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කිරීම.
- කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම හා ඒ සම්බන්ධව උපදේශන රැස්වීම් පැවැත්වීම.
- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ නවෝත්පාදනයන් සහ වාණිජකරණය වේගවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීමේ ව්‍යාපෘතිය සඳහා වැඩමුළු පැවැත්වීම.
- භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම.

ද්‍රව්‍යයක හෝ නිෂ්පාදිතයක සම්භවය කිසියම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක බවත් එහි විශේෂ ගුණාංග, ගතිලක්ෂණ හා කීර්තිනාමයක් එම භූගෝලීය සම්භවයේ හේතුවෙන් ඇතිවී ඇති බැව් පාරිභෝගිකයන්ට හා වෙළඳුන්ට පෙන්නුම් කිරීම සඳහා භූගෝලීය දර්ශක භාවිතා කරනු ලබයි. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම මගින් ලංකා තේ, ලංකා කුරුඳු ආදී භූගෝලීයව වැදගත්කම් දරන ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා පුළුල් විදේශීය වෙළඳපලක් ඇතිකර ගැනීමට අපේක්ෂිතය. දැනට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සතුව භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් නොමැති අතර සහතික ලකුණු ලියාපදිංචි කිරීම පමණක් මෙතෙක් සිදු කර ඇත.

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන IPAS (කාර්මික දේපළ පරිපාලන පද්ධතිය) වැඩිදියුණු කිරීම.

දිගුකාලීන ඉලක්ක

- පේටන්ට් සහ පේටන්ට් නොවන තාක්ෂණික තොරතුරු සඳහා මහජන ප්‍රවේශය වැඩි කිරීම.
- ලිපිගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය හදුන්වා දීම.
- බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් (EIE) ගොඩනැගීම.
- සංයුක්ත පරිපථ (Integrated Circuit (IC)) ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම.
- කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් පද්ධතියට ප්‍රවේශ වීම.
- විද්‍යුත් මාධ්‍යවල විකාශනය වන ගීත,සංගීතමය කලා නිර්මාණ සඳහා මුල් නිර්මාණකරුවන්ට කතෘ භාගය ගෙවීම සම්බන්ධව යාන්ත්‍රනය තව දුරටත් දියුණු කිරීම.

ගීතාංජලී ආර්. රණවක

බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්

3. වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.(අ) වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

3. (අ) 1 මූල්‍ය ප්‍රකාශන

බුද්ධිමය දේපළ අරමුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2020.12.31	2019.12.31
අයභාරය		රු.	රු.
වෙළඳ ලකුණු ආදායම	3	55,822,249	65,078,863
පේටන්ට් ආදායම	3	7,108,482	6,587,974
කාර්මික සැලසුම් ආදායම	3	533,638	805,172
වෙනත් ආදායම්	4	473,269	742,200
ආයෝජන ලාභ		-	909,314
ආයෝජන පොලී ආදායම්	5	64,241.112	70,238,183
මුළු අයභාරය		128,178,750	144,361,706
වියදම්			
වැටුප් වෙතන හා සේවක ප්‍රතිලාභ	2	2,691,540	4,968,034
ප්‍රදාන හා වෙනත් හුවමාරු ගෙවීම්	2	1,077,030	1,068,017
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	2	50,079,471	44,784,566
වෙනත්	2	103,235	162,115
ක්ෂය සහ ක්‍රමක්ෂය	2	7,175,802	6,372,725
මූල්‍ය පිරිවැය	2	-	-
මුළු වියදම්		61,127,078	57,355,456
කාල පරිච්ඡේදයසඳහා වූ අතිරික්තය/(ඌනතාවය)		67,051,672	87,006,250

බුද්ධිමය දේපළ අරමුදල

2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2020.12.31	2019.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන විෂයයන්	8	1,886,552	1,706,397
ලැබිය යුතු ආදායම්	9	8,829,362	50,766,259
කෙටි කාලීන ආයෝජන	7	851,641,767	731,949,520
ඉදිරියට කළ ගෙවීම්	11	5,236	20,058
		862,362,917	**784,442,234**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	6	35,324,725	41,620,851
ලැබිය යුතු ප්‍රතිපූර්ණය කිරීම් - බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන		22,298,751	22,298,751
		57,623,477	**63,919,602**
මුළු වත්කම්		**919,986,394**	**848,361,837**
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	12	10,111,763	4,633,614
ජංගම නොවන බැරකම්		-	-
මුළු බැරකම්		**10,111,763**	**4,633,614**
ශුද්ධ වත්කම්		**909,874,631**	**843,728,223**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
සමුච්චිත අතිරික්තය / ඌණතාවය	10	909,874,631	843,728,223
ශුද්ධ වත්කම්/ස්කන්ධය		**909,874,631**	**843,728,223**

ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී

ආර්.පී.එස්. රාජපක්ෂ
ගණකාධිකාරී
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
සමාගම් මැදුර, 3වන මහල,
400, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

ගීතාංජලී. ආර්. රණවක
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්

ජී. ආර්. රණවක (මිය්ස්)
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
සමාගම් මැදුර, 3 වන මහල,
400, ඩී. ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව බුද්ධිමය දේපළ අරමුදලේ ගණන් විගණනය කිරීමේ කාර්යය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතෙහි 176 (5) වගන්තිය අනුව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශය 2021.02...දින අනුමත කරන ලදි.

ජේ.එම් භද්‍රානී ජයවර්ධන
ලේකම්
වෙළඳ අමාත්‍යාංශය

ජේ. එම්. බී. ජයවර්ධන
ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය
සභාය මහ ලේකම් කාර්යාලය 1
නො. 27, ඩොක්ලෝල් [illegible] කොළඹ 02.

බුද්ධිමය දේපළ අරමුදල

2020.12.31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඍජු ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2020.12.31	2019.12.31
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	රු.	රු.
ලැබීම්		
බදු	2,175	15,895,578
භාණ්ඩ හා සේවා විකිණීමෙන්	95,196,554	108,708,013
පොලී ලැබීම්	106,071,184	49,234,169
අනෙකුත් ලැබීම්	1,013,473	982,219
ගෙවීම්		
සේවක පිරිවැය	(2,742,271)	(5,080,021)
සැපයුම්කරුවන්ට ගෙවීම්	(45,664,349)	(53,895,422)
අනෙකුත් ගෙවීම්	(1,606,526)	(2,371,454)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	152,270,241	113,473,081
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
පිරියත හා උපකරණ මිලදී ගැනීම	(665,654)	(6,013,467)
පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම්	-	-
ආයෝජන කල්පිරීමෙන් ලැබීම්	1,381,471,716	692,200,102
ආයෝජනමිලදී ගැනීම්	(1,501,163,963)	(756,663,633)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(120,357,901)	(70,476,998)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
බදු මුදල් ආපසු ගෙවීම්	-	(11,717,871)
රජයට බෙදාහැරීම්	(31,732,185)	(36,236,004)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(31,732,185)	(47,953,875)
මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩුවීම)	180,155	(4,957,792)
2020.01.01 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	1,706,397	6,664,189
2020.12.31 දිනට මුදල් හා මුදල් හා සමාන දෑ	1,886,552	1,706,397

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රදවාගත් ලාභය/ අලාභය	එකතුව
	රු.	රු.	රු.
2019.01.01 දිනට ශේෂය	753,054,628	-	753,054,628
පූර්ව වර්ෂ ගැලපුම්	-	(1,910,905)	(1,910,905)
ප්‍රත්‍යාගණන ලාභය	-	5,578,250	5,578,250
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	87,006,250	87,006,250
2019.12.31 දිනට ශේෂය	753,054,628	90,673,595	843,728,223
2020.01.01 දිනට ශේෂය	843,728,223	-	843,728,223
පූර්ව වර්ෂ ගැලපුම්	-	(905,264)	(905,264)
ප්‍රත්‍යාගණන ලාභය	-	-	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	67,051,672	67,051,672
2020.12.31 දිනට ශේෂය	843,728,223	66,146,408	909,874,631

3. (අ) 2 වෙන්කර න ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 13 : වෙන්කර න ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කර න ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම (රු.000)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.000)	අවසාන ප්‍රතිපාදනය (රු.000)		
පුනරාවර්ථන	45,100	45,100	43,070	56.92%
ප්‍රාග්ධන	8,000	8,000	665	8.32%

3. (අ) 3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වගුව - 14 : වෙනත් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක නියෝජිතයෙකු ලෙස ලැබුණු ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ලන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
–	–	–	–	–	–	–

3. (අ) 4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - බුද්ධිමය දේපළ අරමුදල

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.000)	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.000)	ඉදිරියේ දී ගිණුම්කරනයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	35,324	35,324	-	100%
9152	යන්ත්‍රෝපකරණ-ශීර්ෂය	4,281	4,281		100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3. (අ) 5 විගණන වාර්තාව - බුද්ධිමය දේපළ අරමුදල



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒඕ/ඒ/අයිපීඕඑෆ්/එෆ්එක්/20/18 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021ඔක්තෝබර් / டீදින

අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමිපිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ xxxvii වන පරිච්ඡේදයේ 176(6) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ඉකුත් වර්ෂයේ වත්කම් පන්ති තුනක් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ රු. 5,578,250 ක ප්‍රත්‍යාගණන ලාභය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස වෙනම පෙන්විය යුතු වුවද, එය සමුච්චිත ඌනතාවයට ගලපා දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමි යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම් හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය නිරූණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම,

(i) සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් අවස්ථා 5932 කින් අවස්ථා 760 ක්ම 2010 වර්ෂයට පෙර ලද ඉල්ලුම්පත් වූ අතර එම ප්‍රමාදය වෙළඳ ලකුණු ලියාපදිංචි ක්‍රියාවලියේ ස්වභාවය සහ සංකීර්ණත්වය මත සිදුවන්නක් බවට අධ්‍යක්ෂ ජනරාල් විසින් අදහස් දක්වා තිබුණි. එසේ වුවත් බුද්ධිමය දේපළ පනතේ 118(1) හා (2) වගන්ති අනුව වෙළඳ ලකුණක වලංගු කාලය ලියාපදිංචි කළ දින සිට වසර 10 කට සීමාවන බැවින් හා ලියාපදිංචිය ඉල්ලුම්කළ දින සිට වලංගුවන පරිදි නිකුත් කිරීම් හේතුවෙන් එම වෙළඳ ලකුණු ලියාපදිංචිය සිදුවන අවස්ථාව වන විටත් අවලංගු වී තිබුණි.

(ii) වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා වර්ෂය තුළ ලද ඉල්ලුම්පත් 9,593 කින් 6,294 ක වැඩ ආරම්භකර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දී වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ මට්ටම දක්වා ක්‍රියාත්මකවී නොතිබුණි.

(iii) ලියාපදිංචිය සඳහා සුදුසුකම් සපුරන ලද ඉල්ලුම්පත් ප්‍රසිද්ධ කිරීම සඳහා වූ ගාස්තු ගෙවීමෙන් පසු ඉල්ලුම්පත් ලියාපදිංචි කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විට එම ගාස්තු ගෙවූ ඉල්ලුම්පත් 3466 ක් ලියාපදිංචි කිරීමට covid -19 වසංගතය හේතුවෙන් නොහැකි වී තිබුණි.

(ආ) පේටන්ට් බලපත්‍රය සඳහා ඉල්ලුම්කළ වසරේදීම එම බලපත්‍රය නිකුත් කිරීමට සැලසුම් කළ යුතු වුවද, 2020 වර්ෂය තුළදී නිකුත් කළ බලපත්‍ර 273 කින් බලපත්‍ර 258 ක්ම 2008 වර්ෂයේ සිට 2018 වර්ෂවලදී ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් වූ බැවින් විශාල ප්‍රමාදයකින් පසුව බලපත්‍ර නිකුත් කර තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් පද්ධතිය වෙත ප්‍රවේශවීම සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තාව සැකසීමට සැලසුම්කර තිබුණද, මූලික අධ්‍යයන කටයුතු පමණක් සිදු කර තිබුණි.

ඩබ්ලිව්.ජී.සී වික්‍රමරත්න
විගණකාධිපති

3 (ආ) වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය - ශීර්ෂය 299

3.(ආ)1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ශීර්ෂය 299

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය — ඒසීඒ-එෆ්
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ශීර්ෂ අංකය - 299 — රු.

අයවැය 2020		සටහන	තක්‍ය 2020	2,019	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
40,880,000	භාණ්ඩාගාර අග්‍රිම		39,702,000	36,003,000	ඒසීඒ-3
	තැන්පතු		21,950	84,301	ඒසීඒ-4
5,000,000	අත්තිකාරම් ගිණුම්		2,927,403	3,478,488	ඒසීඒ-5/5(ඒ)/5(බී)
2,669,400	වෙනත් ලැබීම්		2,398,948	2,315,203	
48,549,400	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		45,050,302	41,880,992	
48,549,400	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		45,050,302	41,880,992	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
44,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	42,575,009	35,919,055	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	-	-	ඒසීඒ-2(ii)
600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	494,930	332,629	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
45,100,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		43,069,939	36,251,684	
	මූලධන වියදම්				

-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසිඒ-2(ii)
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	**මුළු මූලධන වියදම් (ඉ)**		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		1,872,464	3,297,724	
	තැන්පතු ගෙවීම්		21,950	84,301	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,850,514	3,213,423	
45,100,000	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		44,942,403	39,549,409	ඒසිඒ-5/5(ඒ)/5(ඛ)
3,449,400	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		107,899	2,331,583	

3(ආ)2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ශීර්ෂය 299



ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

ශීර්ෂ අංකය - 299

	සටහන	2020 රු.	2019 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,281,267	3,861,267
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	8,848,675	9,925,314
